


ඒ දිනය තමාගේ ජීවිතයේ සුන්දරම දිනය යයි විශ්ව ට සිතුණි. මුලු දවසම අමන්දි ඉතා සතුටකින් සිටියා ය. ඈ විශ්ව ගේ සිත්තම වෙනුවෙන් වෙහෙස නොබලා බොහෝ වේලාවක් එක ඉරියව්වේ සිටියා ය. සිනාසුණා ය. කවට කම් කළා ය. දැහැනට සමවැදුණාක් මෙන් සිත්තම නිමවන විශ්වට ගල් කැබිලිති වලින් පහර දුන්නා ය.

ඇයට සියල්ල අමතකව ගියා සේ ය. විශ්ව ඒ පිළිබඳව මහත් සතුටට පත්ව සිටියේ ය. අමන්දි නම් වන මේ සොඳුරු යුවතිය මිය යමින් සිටින්නේ ය යන්න සිහි කරන්නට පවා ඔහු අකැමැති විය. එය එසේ විය නොහැකි ය. එසේ වන්නට ඉඩ දිය නොහැකිය යන දැඩි අදිටනක් ඔහු සිත තුළ වැඩෙමින් තිබුණි. යමක් කළ යුතුය. කළ යුත්තේ කුමක් දැයි නොවැටහෙයි. එනමුදු ඇය සතුටෙන් තැබිය යුතු ය. දැනට කළ හැකි වන්නේ එය පමණකි. ඒ සඳහා හෝ වෙහෙසිය යුතු ය.

"මට ඔයාව ඉස්සෙල්ලම හමුවුණේ කැළණි පන්සලේදි.. එදා මං හුඟක් කලබල වෙච්ච දවසක්.. ඔයා පන්සලේ චිත්‍ර ෆොටෝ ගනිමින් හිටියා... මතකයි ද..? "

"මට නිච්චියක් නැහැ..." ඔහු කීවේ සැබෑවකි.

"එහෙනං මතකද මං චිත්‍ර ඉගෙනගන්න අහන්න ඔයා හමුවුණ දවස...?" අමන්දි ඇසුවා ය. විශ්ව හිස වනා මතක බව ඇඟෙව්වේ ය.

"ඔයා එදා මට කතා කළේ හරිම නපුරු විදිහට.." අමන්දි කීවා ය. ඔහු සිත්තම වෙතින් ඇස් මෑත් කළේ ය. පැන්සල ඊසලය මත තබා ඇය වෙත ආවේ ය. වාඩි වී සිටි ඇගේ උරහිස මත දෑත තැබූ ඔහු ඇගේ නෙත් දෙකට එබී බැලුවේ ය. "මහා නපුරෙක් ඔයා.." ඈ කීවා ය.

"සමාවෙන්න.." ඔහු කීවේ ය.

අමන්දි සිනාසුණා ය.

"අද සමාවෙන්න කිව්වට මගේ හිතේ ඇති වුණ දුක අඩු වෙන්නැහැනෙ.."

ඇය කීවේ කවට කමට ය. එහෙත් ඔහු සිනාසුණේ නැත.ඒ වෙනුවට ඔහු හෙලූ දිග සුසුම සිය මුහුණ මත පතිත වනු ඇයට දැනුණි. ඇය ඉදිරියේ දණින් සිටගත් ඔහු ඇගේ දෑතම එක්කොට අල්ලා ගත්තේ ය.

"ආයෙත් කියන්නම්.. සමාවෙන්න.. ඒක මගේ අතින් වෙච්ච ලොකු වරදක්.. ලොකුම ලොකු වරදක්.. ආයෙ කවදාවත් නොකරන වරදක්.. අපි ලංකාවට ගිය ගමන් පන්තිය පටන් ගනිමු.." ඔහුගේ දෑස් කණගාටුවෙන් කුඩා වී තිබෙනු අමන්දි දුටුවා ය. "...මං දන්න හැම දේම ඔයාට කියලා දෙන්නම්.. ලෝකය දිහා චිත්‍ර ශිල්පියෙකුගෙ ඇහෙන් බලන හැටි මං ඔයාට පෙන්නලා දෙන්නම්.. හැම සියුම් රේඛාවකම රැඳිච්ච කලාව මං ඔයාට උගන්නන්නම්.. ජීවිතේ දිහා අලුතෙන් බලන්න මං ඔයාට කියලා දෙන්නම්.. ගහක වැලක මලක එහෙමත් නැත්නම් රළු කලුගලක හැංගිච්ච අපූර්වත්වය සිත්තමක් කරන හැටි මං ඔයාට කියලා දෙන්නම්.. විශ්වාස කරන්න... මා ළඟ තියෙන හැම දෙයක්ම මං ඔයාට දෙන්නම් අමන්දි.."

0000

අමන්දි සිටියේ ඉතා සතුටකිනි. ඒ සතුටට හේතුව විශ්වජිත් බව නිමන්ත දනියි. ඇය විශ්වජිත් සමගින් පිටතට ගිය දා සිට ඇගේ සිතේ කණස්සල්ල පහව ගොස් ඇති බව ඔහු නිරීක්ෂණය කරමින් සිටියේ ය. ඈ විශ්වජිත් ගේ දක්ෂතා පිළිබඳව කෙළවරක් නැතිව නදී හා කතා කරනු නිමන්ත අසා සිටියේ ය. ඒ අතොරක් නැති වර්ණනා පිළිබඳ ඊර්ෂ්‍යාවක් තම සිතේ ඇති නොවුණේ මන්දැයි තේරුම් ගන්නට ඔහුටම නොහැකි විය. ඇගේ සතුට තම සිතේ වූ මහා බරක් බිම තැබුවාක් මෙන් විශාල සැනසිල්ලක් ඔහුට ගෙන දුන්නේ ය. මේ සතුට ඇයට යහපතක් ම කරනු ඇතැයි යන විශ්වාසය ඔහුගේ සිතට මහත් සහනයක් ගෙන දුන්නේ ය..

අමන්දි සතුටින් තැබීම සඳහා ඕනෑම මිලක් ගෙවන්නට නිමන්ත සූදානමින් සිටියේ ය. ඇගේ ජීවිතය වෙනුවෙ-න් කැප කළ නොහැකි දෙයක් තමා වෙත තිබිය නොහැකි බව ඔහු දත්තේ ය.

"අපි ලංකාවට ගිය ගමන්ම පන්තිය පටන් ගන්න විශ්ව කැමති වුණා.." අමන්දි කීවා ය. නිමන්ත සිනාසුණේ ය.

"විශ්වනාත් හොඳ මිනි-හෙක්.." ඔහු කීවේ ය. " .. මතුපිටින් රළු බවක් පෙනුණාට මිනිහට තියෙන්නෙ උණු වෙන හිතක්.."

අමන්දි නිමන්ත ගේ බස නෑසුණා සේ ඈත බලා සිටියා ය. ඇගේ සිත අදහස් රැසකින් පිරී ඉතිරී ගොස් තිබුණි. ඒ සියල්ල කැන්වස් තිර මත තවරා හිත නිදහස් කර ගැනීමේ දැඩි අවශ්‍යතාවක් ඇයට විය. ඒ සඳහා විශ්වජිත් දැන් අවසරය දී ඇත. ඔහු සමීපයේ සිට ඔහුගෙන් උකහා ගත යුතු දැනුම ඉක්මණින් අත්පත් කර ගත යුතු ය.

ජීවිතය සුන්දරය. ඒ ජීවිතය මහත් වූ ලෝබ කමකින් ඇද බැඳ තබා ගත යුතු බව බො-හෝ කලකට පසු අමන්දිට සිතුණි.

00000

ලංකාවට ආ දා සිට විශ්වජිත් සිටියේ සිත එකලස් කරගනු නොහැකිව ය. අමන්දි හැර දා එන්නට සිදුවීම ඔහුට මහත් පීඩාවක් විය. දරා ගත නොහැකි තරම් පාලුවක් ඔහුගේ සිත වසාගනිමින් පැතිර ගොස් තිබුණි.

අඳින්නට සිතා සිටි සියලුම සිත්තම් පසෙක ලා ඔහු ඇගේ සිත්තම නිම කරන්නට මහත් වෙහෙසක් ගනිමින් සිටියේ ය. ඒ සඳහා ඔහුට ඇගේ සේයාරුව දෙස බැලීමේ අවශ්‍යතාවක් හෝ නොවී ය. ඇගේ මුහුණේ සැඟවුණ සියුම් භාවයන් ඔහුගේ මනැසේ මැනැවින් ඇඳී තිබුණි. අමන්දි නම් වන සුන්දර යුවතියගේ රුව කිසිදා නොමැකෙන ලෙසින් ඔහුගේ සිතේ ඇඳී තිබුණි.

වළක්වා ගත නොහැකි ලෙසින් තමා ඇය වෙත ආකර්ශනය වෙමින් සිටින බව ඔහුට වැටහෙයි. එය නිවැරදි කටයුත්තක් නොවන බව දැනුණ ද මහත් වූ ලෝබ කමකින් ඇය වෙතම ඇලෙන්නට ඔහුගේ සිත බලකරමින් සිටියේ ය.

ඇය මිය යමින් සිටින්නී ය යන කරුණ පවා ඔහුගේ සිතින් බැහැර වෙමින් තිබුණි. ඇයට ජීවය දිය යුතු ය. ආදරය ධෛර්යය ශක්තිය අධිෂ්ඨානය මේ සියල්ල ඇගේ සිත්තම තුළ ගැබ් කළ යුතු ය. ඇගේ ක්‍ෂය ගිය මුහුණෙහි නිල් කැට දෙකක් මෙන් දිලුණ දෑස් තමාගේ සිත්තම තුළ ද ඒ දීප්තියෙන්ම ජීවමාන කරන්නට කරන්නට ඔහු මහත් වෙහෙසක් ගත්තේ ය.

උදෑසනින්ම පාඩම ගන්නට ආ ශාමිලා ආපසු ගියේ අසතුටිනි.

"සොරි ශාමිලා... අද මට පාඩම කරන්න බැහැ.. " ඔහු කිවේ ය. තමා දකින විට වෙනදාට දීප්තිමත් වන ඔහුගේ දෙනෙත් මලානිකව තිබෙනු ඇය නිරීක්ෂණය කළා ය. ඔහු වෙනස් වී ඇත. වෙනදාට තවුසකුගේ දෑස් මෙන් නිවුන ඔහුගේ දෑස තුළ අද රැඳී ඇති අසාමාන්‍ය කැළඹීම ඇය වහා හඳුනා ගත්තා ය.

"සර්ට තාම මහන්සියි වගේ ද..?" ඈ ඇසුවා ය. ".. මං.. මං තේ එකක් හදන්න ද..?"

ඔහු වෙනුවෙන් යමක් පිලියෙල කර දීම ඇයට අමුතු දෙයක් නොවේ. ඔහු වෙතින් චිත්‍ර ශිල්පය ඉගෙන ගැනීම ඇරඹූ දා සිටම තමන්ට හැකි සැම විටම ඈ ඔහු වෙනුවෙන් එවැනි දේ කළා ය. තමා ඔහු වෙනුවෙන් තේ කෝප්පයක් පිළියෙල කරන විට වෙනදා මෙන් ඔහු ඈත සිට ඇළ කරගත් හිසින් සිනාසෙමින් බලා සිටින අයුරු දකින්නට ඇගේ සිතේ මහත් ලෝබ කමක් විය.

"තේ එක හරිම රසයි.." ඔහු කියනු අසන්නට ඕ සැමදාම කැමැත්තෙන් සිටියා ය.




අද ඔහු අසනීපයෙන් විය යතු ය.

"මං කොත්තමල්ලි එකක් හදන්න ද සර්..?" ඕ නැවත ඇසුවා ය.

"එපා.." ඔහු හිස එසෙව්වේ නැත. ඒ පිළිතුරේ ගැබ්ව තිබුණ නොරුස්නා බව බව වටහා ගන්නට ඇයට අපහසු